ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

මගේ අංකය: PS/LD/237/2018

2018 ජූලි මස 18 වන දින

**ජනාධිපති නීතිඥවරයන් පත් කිරීම - 2018**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වෙනි ව්‍යවස්ථාව අනුව ජනාධිපති නීතිඥවරයන් පත් කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමන්ගේ අවධානය යොමු වී ඇත.

එබැවින් නීතිඥ වෘත්තියේ විශිෂ්ඨත්වයට පත්ව ඇති සහ පැවැත්මේ හා වෘත්තියේ අවංකභාවයේ උත්කෘෂ්ඨත්වය පවත්වාගෙන ඇත්තාවූ නීතිඥවරයන් සම්බන්ධයෙන් අයදුම්පත් කැඳවීමට අදහස් කර ඇති බව දන්වමි.

මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන සුදුසුකම් ලාභීන් විසින් මේ සමඟ ඇති අයදුම්පත්‍රය සම්පූර්ණ කර 2018.08.05 දිනට පෙර පහත සඳහන් ලිපිනයට යොමු කරන මෙන් කරුණිකව දන්වමි.

| |
|---|
| **ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය, කොළඹ 01.** |

**සුදුසුකම්**

1. නීතිඥ වෘත්තියේ අවම වශයෙන් අවු. 25ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
2. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කිනම් හෝ කාරණාවක් සම්බන්ධයෙන් දෝෂ දර්ශනයට ලක් නොවූ නීතිඥවරයකු වීම.
3. විනයානුකූල කටයුත්තකට විෂයගත වූ නීතිඥවරයකු නොවීම.
4. යහපත් කීර්තියක් හා නීතිය පිළිබඳ මනා දැනීමක් හා දක්ෂතාවයක් සහිත වීම.

ඉහත පත් කිරීම් වලට අදාලව කුමන හෝ ආකාරයක බලපෑම් කිරීම නුසුදුස්සකු බවට පත් වීමට හේතුවන බව ද දන්වමි.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

උදය ආර්. සෙනවිරත්න
ජනාධිපති ලේකම්

ගාලු මුවදොර, කොළඹ 01
காலி முகத்திடல், கொழும்பு 01
Galle Face, Colombo 01
දුරකථන / தொலைபேசி / Telephones ++ 94 (0) 11 2354418, ++ 94 (0) 11 2473873
ෆැක්ස් / தொலைநகல் / Fax ++ 94 11 2446657
ඊ-තැපැල / மின்-அஞ்சல் / e-mail prsec@presidentsoffice.lk